# අ.පො.ස. (සා.පෙළ) විභාගය
# බුද්ධ ධර්මය
## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 - 3 | 2 - 4 | 3 - 3 | 4 - 1 | 5 - 3 | 6 - 2 | 7 - 3 | 8 - 4 |
| 9 - 2 | 10 - 1 | 11 - 4 | 12 - 2 | 13 - 2 | 14 - 4 | 15 - 3 | 16 - 1 |
| 17 - 4 | 18 - 3 | 19 - 2 | 20 - 1 | 21 - 4 | 22 - 2 | 23 - 1 | 24 - 4 |
| 25 - 3 | 26 - 2 | 27 - 3 | 28 - 1 | 29 - 2 | 30 - 2 | 31 - 2 | 32 - 4 |
| 33 - 3 | 34 - 1 | 35 - 1 | 36 - 3 | 37 - 3 | 38 - 3 | 39 - 3 | 40 - 3 |

## II කොටස

(01) i. බුදු, පසේබුදු, මහරහත් / සම්මා සම්බුද්ධ, පච්චේකබුද්ධ, අරහන්ත බුද්ධ

ii. ගිලානෝපස්ථානය / ගිලනුන්ට උපස්ථානය කිරීමේ ගුණය

iii. කයෙන් සංවර වීම මැනවි / වචනයෙන් සංවර වීම මැනවි / කායික වාචික සංවරය යහපත්ය.

iv. ජේතවනාරාමය (දෙව්රම් වෙහෙර), පූර්වාරාමය (මිගාර මාතා ප්‍රාසාදය)

v. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව.

vi. දුටුගැමුණු රජතුමා / දුට්ඨගාමිණී අභය රජතුමා / දුටුගැමුණු

vii. ධාර්මිකව උපයාගත් ධනය පරිභෝග කිරීමෙන් ලැබෙන සැපයයි.

viii. මෙය නැති කල්හි මෙය ඇති නොවේ - මෙය නැති වීමෙන් මෙය නැතිවේ.
මෙය නැති කල්හි මෙය නොවේ - මෙය නැති වී යාමෙන් මෙය නැතිව යයි

ix. බුදුගුණ අලංකාරය - වීදාගම මෛත්‍රිය හිමි / වීදාගම හිමි)
පූජාවලිය - බුද්ධ පුත්‍ර හිමි / මයුරපාද පිරිවෙන්පති

x. ථූපාරාමය (ලකුණු 20යි)

(02) i. * අනුසෝතගාමී යනු, ගඟ පහළට යන්නා සේ මිනිසා ද රාගාදී, ක්ලේශ ධර්මයන් කරාම යොමුවීමයි.

* පටිසෝතගාමී යනු බුදු දහමෙන් උඩුගම්බලා යන්නා සේ රාගාදී ක්ලේශ ධර්මයන්ගෙන් මිදීමට උත්සාහවන්ත වීමයි. (ලකුණු 02යි)

ii. නෙළුම් මල මඩ වතුරෙන් ඉහළට මතුවී එහි නොගෑවී සිටියි. අපිරිසිදු ජලය සහිත මඩ වතුරක හට ගන්නා නෙළුම් මල එය ඉක්මවා උඩට මතුවී විකසිත වී දසත සුවඳ විහිදුවයි. එම නෙළුම්මල් මෙන් බුද්ධාදී උතුමෝ කෙලෙස් මඩ වතුරෙන් ඉහළට නැගී එහි නොගෑවී වැඩ වසති. එම නිසා බුදු සිරිතද පද්මාකාර ලෙස හඳුන්වනු ලැබේ. (ලකුණු 03)

iii. බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර ජීවිතයෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ බොහෝ ය.

- දුශ්චරිතයෙන් මිදී සුචරිතයට යාම.
- ශික්ෂාකාමී වීම.
- අටලෝ දහමින් කම්පා නොවීම.
- යහපත් ලෙස ශිෂ්‍ය පෞරුෂය ඇතිකර ගැනීමට හැකිවීම.
- සියලු ගැටුම් හමුවේ සාමකාමී බව ඇතිකර ගැනීමට හැකිවීම.
- සිසුන් අතර මෛත්‍රිය, කරුණාව, දයාව සහිතව ක්‍රියා කිරීමේ හැකියාව.
- සියලු දේ උපේක්ෂාවෙන් විඳ ගැනීමට හැකිවීම.

(මෙබඳු ආදර්ශ තුනක්වත් ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු 5යි)

(03) i. සුකරානි අසාධූනි - අත්තනෝ අත්තනෝ අහිතානිච
යං වේ හිතංච සාධුං ච - තං වෙ පරම දුක්කරං (ලකුණු 02යි)

ii. තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතා පහසු ය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය. (ලකුණු 03යි)

iii. ධම්ම පදයේ අඩංගු ගාථා මඟින් අප ජීවිතය සකස්කරගත යුතු ආකාරය, කළයුතු දෙය, නොකළ යුතු දෙය මැනවින් පෙන්නා දෙයි. පුද්ගලයා වරදින් මුදවා සුචරිතයෙහි යෙදවීම සඳහා ධම්මපදය ආදර්ශ සපයයි. මිනිසා නිරන්තරයෙන් අයහපතට, පාපයට නැඹුරු වෙයි. යමෙකු කළ දේ සිතමින් වෛරය නැවත නැවත බඳී නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳෙන බව උදාහරණයක් ලෙස දී ඇති ''අක්කොච්චිමං අවධිමං ...'' යන ධම්මපද ගාථාවෙන් පැහැදිළි වේ. ධම්මපද ගාථා දේශනා කොට තිබෙන්නේ විවිධ සිදුවීම් මුල්කොටගෙන ය. ඒවා නිදාන කථාව ලෙසින් හැඳින්වේ. පුද්ගලයා නිවැරදි යහපත් මාර්ගයට ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ධම්ම පදයෙන් ලබා දේ. ඒවායේ සඳහන් උපමා, උදාහරණ, දේශය, කාලය හා පුද්ගල භේදයකින් තොරව ඕනෑම පුද්ගලයෙකුට අනුගමනය කොට යහපත සලසා ගැනීමට පුළුවන. ධම්මපදයේ භාෂාව සරලයි. සැම කෙනෙකුට ම හුරු පුරුදු උපමා උපමේයවලින් යුක්ත වේ. බුද්ධ වචනයේ සම්පිණ්ඩනය අන්තර්ගතවීමත්, පුද්ගල ජීවිතයේ විවිධ ගැටලු සහ ඒවාට විසඳුම් ඉදිරිපත් වීමත්, උත්සාහය, අධිෂ්ඨානය, ඉවසීම, කරුණාව, මෛත්‍රිය ආදී ගුණධර්ම පුද්ගල දියුණුව ඇතිකරන බවත් පෙන්වා දිය හැකිය. එහි සඳහන් වන උට්ඨානවතෝ සතිමතෝ ගාථාවෙන් ද පුද්ගලයාගේ දියුණුවට හේතුවන කරුණු පැහැදිළි වේ. මේවා පිළිපැදීමෙන් පුද්ගල ජීවිතය ආලෝකමත් කර ගැනීමට පුළුවන.

(04) i. පැවිදි උතුමන් / මහණ බමුණන් / ශ්‍රමණ / සමණ / බ්‍රාහ්මණෝ (ලකුණු 02යි)

ii. උඩ දිසාවට අයත් සමාජ කණ්ඩායම් විසින් ඉටු කළ යුතු යුතුකම්.

ගිහි පක්ෂය ඉටුකළ යුතු යුතුකම් පහකි.

- මෛත්‍රී සහගතව ක්‍රියා කිරීම.
- මෛත්‍රීසහගතව කතා කිරීම.
- මෛත්‍රී සහගත සිත් පහළ කිරීම.
- නිවසට පැමිණි විට සතුටින් පිළිගැනීම.
- ආමිසයෙන් සංග්‍රහ කිරීම.

පැවිදි පක්ෂය ඉටුකළ යුතු යුතුකම් හයයි.

- පවින් වැළැක්වීම.
- යහපත් ක්‍රියාවල යෙදවීම.
- හොඳ සිතින්ම අනුකම්පා කිරීම.
- නොඇසූ දේ කියා දීම.
- ඇසූ දේ වඩාත් පැහැදිළි කර දීම.
- සුගතියට මග පෙන්වීම.

(ලකුණු 03යි)

iii. ආපදා අවස්ථාවකදී අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටුකිරීම ඉතා වැදගත් වේ. වසංගත රෝග, සුළි සුළං, නාය යෑම්, සුනාමි, නියඟය වැනි ස්වභාවික හෝ මිනිස් ක්‍රියාකාරකම් මත සිදුවන ආපදා වැනි අවස්ථාවන්හිදී එකිනෙකාට අවශ්‍ය පරිදි සහයෝගය දීම අති උතුම් ක්‍රියාවකි. ආපදා අවස්ථාවන්හිදී එයට මුහුණ දෙන සහෝදර ජනතාවට ආහාරපාන, ඇඳුම්, පැළඳුම්, මුදල් ආධාර ආදී අත්‍යවශ්‍ය දේ ගෙන ගොස් සිත සතුටින් බෙදා දීම, ඔවුන්ගේ මානසික සුබ සිද්ධිය සඳහා අවශ්‍ය පරිදි සුදුසු ක්‍රියාකාරකම් සිදු කිරීම වැනි යහපත් උතුම් ක්‍රියාකාරකම් අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීම ඉතා වැදගත් වේ.

පැවිදි පක්ෂය හා ගිහි පක්ෂය බැලීමේදී ආමිසයෙන් තමන්ට සංග්‍රහ කරන ගිහියාට පෙරළා ධර්ම දානයෙන් සංග්‍රහ කිරීම පැවිද්දාගේ යුතුකමකි. එනම් ගිහියා පවින් වැළැක්වීම, යහපතෙහි යෙදවීම, හොඳ සිතින් අනුකම්පා කිරීම, නොඇසූ දේ කියා දීම, ඇසූ දේ වඩාත් පැහැදිලි කිරීම හා සුගතියට මග පෙන්වීම යන අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීම තුළින් මානසික ශක්තිය ගොඩනැගීම අන්‍යෝන්‍ය සුහදතාවය, සහජීවනය වැනි යහපත් සමාජ ධර්ම ගොඩනැගේ. වර්තමානයේ මුළු ලොවම මුහුණ දී ඇති කොරෝනා උවදුර වෙනුවෙන් මුළු ලොවම කෙරෙනා අන්‍යෝන්‍ය සුහදතාවය කොතෙක් වැදගත් වන්නේදැයි අපට පෙනේ. මේ අනුව ආපදා අවස්ථාවකදී අන්‍යෝන්‍ය වශයෙන් යුතුකම් ඉටු කිරීමේ වැදගත්කම අගය කළ හැකියි.

(ලකුණු 5යි)

(05) i. පැවැත් වූ ස්ථානය - මාතලේ අලුවිහාරය / ආලෝක විහාරය / අලු ලෙන
සහභාගි වූ භික්ෂූන් සංඛ්‍යාව - භික්ෂූන් වහන්සේලා පන්සියනමක්.

(ලකුණු 02යි)

ii. තුඩුදුන් හේතු
- පිරිසිදු ථෙරවාදී බුදු දහම වෙනත් දුර්මතවලින් හානි වේ යැයි සිතා එය වළක්වා ගැනීම.
- බැමිණිතියා නම් සාගතය ඇතිවීම.
- සාගතයෙන් ඇති වූ අභේනිය නිසා දහම කට පාඩමින්ම පවත්වාගෙන යාම අනතුරුදායක බව වැටහීම.
- වළගම්බා රාජ්‍ය සමයේ ඇති වූ දකුණු ඉන්දීය ආක්‍රමණ.
- ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාවය ඇතිවීම.
- ලාංකේය භික්ෂූන් කණ්ඩායම් දෙකට බෙදී සිටීම.
- ධර්මය ඇසීම, ඉගෙනීම හා පර්යේෂණ කිරීමට ලේඛනගතව තිබීම වඩාත් වැදගත් බව සිතීම.

(ලකුණු 03යි)

iii.
- ත්‍රිපිටක ධර්මය වාචෝද්ගතව පවත්වාගෙන යාමෙන් එහි කිසියම් විකෘතිතාවක් ඇති වීමට තිබූ ඉඩකඩ මෙතුළින් මග හැරී යාම.
- භික්ෂූන් වහන්සේලා නිකායාන්තර වශයෙන් බෙදී විවිධ මතවාදයන්හි පිහිටා ධර්මය විවරණය කිරීම තුළින් ථෙරවාදී බුදු දහමට එල්ල වීමට තිබූ අභියෝග අවම වීම.
- පසුකාලීනව ථෙරවාදී බුදු දහම අභාවයට ගිය අවස්ථාවලදී නැවත එය ස්ථාපිත කිරීමට හැකිවීම නවත් වාසියකි.
- මෙම ථෙරවාදී බුදු දහම ලොව වෙනත් රටවල අභාවයට ගිය අවස්ථාවන්හිදී නැවත ස්ථාපිත කිරීමට ග්‍රන්ථාරූඪ කොට සුරක්ෂිතව පැවැති ලාංකික ධර්ම ග්‍රන්ථ උපකාරී වීම.
- බුදු දහම ස්ථාපිත නොවූ බටහිර රටවල බුදු දහම බෙදා හැරීමට ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර තිබීම ප්‍රයෝජනවත් විය.
- ධර්ම විනය දෙකෙහි සුරක්ෂිතතාව මෙම සංගායනාව මඟින් සැලසුන නිසා මුඛ පරම්පරාගතව පුද්ගලයන් සතුව පවතිනවාට වඩා ස්ථාවරව, ලිඛිතව තිබීම නිසා එය සුරක්ෂිත කර ගැනීමට අවස්ථාව සැලසුණි.


(ලකුණු 05)

(06) i. ස්තූප ආකෘති හයෙන් දෙකක්.

1. ඝණ්ඨාකාර - සීනුවක හැඩය ඇති
2. ඝටාකාර - කළයක හැඩය ඇති
3. බුබ්බුලාකාර - දිය බුබුලක හැඩය ඇති
4. ධාන්‍යාකාර - ධාන්‍ය ගොඩක හැඩය ඇති
5. පද්මාකාර - පියුමක හෙවත් නෙළුම් මලක හැඩය ඇති
6. ආමලාකාර - නෙල්ලි ගෙඩියක හැඩය ඇති.

(ලකුණු 02යි)

ii.




(ලකුණු 03යි)

iii. බෞද්ධ ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම නිර්මාණය වනුයේ දාගැබ් වහන්සේ ය. දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන හෙළ සංස්කෘතියේ ප්‍රෞඪත්වය ලොවට හෙළිකරන ජාතික උරුමයන් රැසක් අප සතුව පවතී. ලොවක් මවිතයට පත් කරන විවිධ කලා නිර්මාණවලින් පොහොසත් මෙම පුණ්‍යභූමියේ පිහිටා පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම ලාංකික අප සැමගේ ම යුතුකමකි. එය අනාගත පරපුර වෙනුවෙන් සුරැකීම අපේ වගකීමයි. එය තනි පුද්ගලයෙකුට හෝ එක් ආයතනයකට පමණක් කළ හැකි කාර්යයක් නොවේ. ඇතැමුන් සිතා මතා කරනු ලබන ක්‍රියාකාරකම් නිසා අප සතු බෞද්ධ කලා ශිල්ප විනාශ වීමේ තර්ජනයකට මුහුණ පා තිබේ. මේවා ආරක්ෂා කර නොගතහොත් මතු පරපුරට අතීත උරුමයන් දැක ගැනීමේ අවස්ථාව අහිමිවනවා පමණක් නොව වසර දහස් ගණනක අපේ ප්‍රෞඪ ඉතිහාසය තහවුරු කරන ජීවමාන සාක්ෂිද අහිමිවේ. එම නිසා හැකි සෑම අවස්ථාවකම මේවා ආරක්ෂා කිරීමට යොමුවිය යුතු ය. පුරාවස්තු මංකොල්ලය, නිදන් හෑරීම, අන්තවාදී ක්‍රියා ආදිය නිසා රටක් ජාතියක් වශයෙන් අප උරුම කරගෙන තිබෙන ජාතික උරුමයන්ට හානියක් සිදු නොවීමට ඉඩ නාදී ආරක්ෂා කර ගැනීම අප සියලු දෙනාගේ වගකීමකි, යුතුකමකි.

(ලකුණු 05)

(07) i. **ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා :-**

ශතවර්ෂ තුනකට අධික කාලයක් තුළ ජාතික හා සංස්කෘතික නිදහස විදේශිකයන්ට යටත්ව පැවැති ඒ අඳුරු යුගයේ සිංහල බෞද්ධයා හට නිදහසක් ලබා ගැනීමට අවස්ථාව උදාකර දුන් උතුම් වීරවරයෙකි අනගාරික ධර්මපාල තුමා. රජයේ තනතුරු, තාන්න-මාන්න හිමිවූයේ කිතු දහම වැළඳගත් අයට පමණක් වූ අභාග්‍ය සම්පන්න යුගයක 1844 සැප්තැම්බර් 17 දින දොන් ඩේවිඩ් හේවාවිතාරණ නමින් මොහු ජන්ම ලාභය ලැබීය.

කුඩා කල සිට ම පන්සල ඇසුරු කරමින් බොදු ගුණ ධර්මයෙන් පෝෂණය වී හෙන්රි ඕල්කට්තුමා සමඟ එකතුව බුදු දහම නගාසිටුවීමට කටයුතු කළේය. බෞද්ධ දරුවන්ට මිෂනාරි අධ්‍යාපනය වෙනුවට බෞද්ධ අධ්‍යාපනයක් ලබා දීමට බෞද්ධ පාසල් ආරම්භ කළේය. බුදු දහම පිළිබඳ දේශන පවත්වමින් ''සිංහලයිනි නැගිටිවු - බුද්ධගයාව බේරා ගනිවු'' යනුවෙන් සිංහල බෞද්ධයා අවධි කරගෙන බුද්ධ ගයාව බේරා ගත්තේය. ගව ඝාතනයට හා ගව මස් කෑම, රහමෙර පානය ආදී පස් පව්වලට එරෙහිව ක්‍රියා කරමින් බොදු පිළිවෙත් ලෝකයට හඳුන්වා දුන්නේය.

එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, බරණැස මූලගන්ධ කුටි විහාරය, කල්කටාවේ ධර්මරාජික විහාරය, බුද්ධගයාවේ හා මද්‍රාසියේ බෞද්ධ විශ්‍රාමශාලා ආදිය ඉදි කළේය. විශාල ආගමික ශාසනික සේවාවක් ඉටු කරමින් අවසන් භාගයේ ''සිරි දේවමිත්ත ධර්මපාල'' යන නමින්

පැවිදි වී 1933 වර්ෂයේ උපසම්පදාව ලබා 1933 අප්‍රේල් මස 29 දින "සම්බුද්ධ සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා! යන ප්‍රාර්ථනාව ඇතිව සිහිනුවණින් යුතුව අපවත් විය. සිංහල බෞද්ධයින් අවදි කරලීමට, දහම් අධ්‍යාපනය නගාසිටුවීමට මෙන් ම, සම්බුද්ධ ශාසනය පුබුදුවාලීමට ද මෙතුමාගෙන් අනුපමේය අතිවිශාල මෙහෙයක් ඉටු විය.

(ලකුණු 05)

ii. **සමජීවිකතා :-**

බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී, සිඟාලෝවාද සූත්‍රයේදී, පත්තකම්ම සූත්‍රයේදී වැනි දේශනා රැසක් මගින් ධාර්මිකව ධනය උපයා ගත යුතු ආකාරය හා ඒවා සමසේ පරිහරණය කිරීම පිළිබඳ ව දේශනා කොට ඇත. බුදුරජාණන් වහන්සේ ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී දීඝජානු කෝළිය පුත්‍රයාට පුද්ගලයාගේ මෙලොව හිත සුව පිණිස දේශනා කළ කරුණු අතර සිව්වන කරුණ ලෙස සමජීවිකතාව හඳුන්වා දිය හැකිය. තමාගේ ආදායම හා වියදම පිළිබඳ මනා අවබෝධයෙන් යුතුව ආදායමට වඩා වියදම වැඩි නොකොට එය-වැය මනාව පැලනය කර ගැනීම සමජීවිකතාවයයි. උසස් ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට විශාල ධනයක් ඉපයීම අත්‍යවශ්‍ය නොවේ. ලැබෙන සුළු දේ වුවද පරිහරණයේදී පමණ දැන කටයුතු කළ යුතු ය. එසේ කිරීමෙන් පුද්ගලයෙකු හට මෙලොවදී ලද හැකි ඉහළ ම සැපය වන "අණන සුඛය" හෙවත් ණය නොවී සිටීමේ සැපය ලබා ගත හැකි ය. මෙවැනි පුද්ගලයින් තුළ අල්පේච්ඡතා ගුණය ද හොඳින් ඇති නිසා සුභරතාව හෙවත් පහසුවෙන් පෝෂණය කළ හැකිවීමේ ගුණය ද ඔහු සතුවන නිසා ඔහු අය-වැය හොඳින් හැඳින කටයුතු කිරීමට පෙළඹෙයි. අඩු ආදායමක් ලබා වැඩියෙන් වියදම් කිරීම තම පරිහානියට හේතු වේ. එසේ ම ඉහළ ආදායමක් ලබා ඉතා සුළුවෙන් වියදම් කරමින් ලෝභීව ජීවත් වීමද බුදු දහම අනුමත නොකරයි. මේ අනුව බුදු දහමට අනුව අය-වැය සමව දැන පරිහරණය කිරීම සමජීවිකතාවයයි.

ii. **සතර අගතිය :-**

නීතියට, යුක්තියට, ධර්මයට, සාධාරණත්වයට එරෙහි වී කටයුතු කිරීම අගතිගාමී වීමයි. රාජ්‍ය නායකයෙකු ගතියට පෙළඹවන කරුණු හතරක් සතර අගතිය නමින් හඳුන්වයි. ඒවා නම්, ඡන්ද, ද්වේශ, භය, මෝහ නම් වේ. මෙම සතර අගතියට යන්නාගේ යසස අව පක්ෂයේ සඳ මෙන් පිරිහෙන බවද, අගතියට නොයන තැනැත්තාගේ යසස පුන් සඳ මෙන් වැඩෙන බවද බුදුරජාණන් වහන්සේ වදාළ සේක. එය රාජ්‍ය පාලකයකුට මෙන්ම අප හැමට අදාළ වන්නකි.

ඡන්දය යන්නෙන් අර්ථවත් වන්නේ කැමැත්තයි. තම නෑදෑකම, හිතවත්කම, පක්ෂපාතීත්වය, තමන්ගේ කම ආදී කරුණු පදනම් කරගෙන අගතයට යා හැක. නමුත් රාජ්‍ය පාලනයේදී පෞද්ගලික රුචි අරුචිකම් නොසලකා යුක්ති සහගතව කටයුතු කිරීමෙන් ඡන්දයෙන් අගතියට යාම වැළකේ.

ද්වේශය යනු විරුද්ධවාදීව ක්‍රියා කරන චෛතසිකයයි. තමන්ට පක්ෂපාතී නොවන අන්‍යයන්ට නීති විරෝධීව කටයුතුකම් කිරීම මෙහි ස්වභාවයයි. පාලකයා මධ්‍යස්ථව, යුක්තිගරුකව කටයුතු කිරීමෙන් මෙම ද්වේෂයෙන් මිදිය හැකි වේ.

භය යනු බිය වීමයි. තමා යටතේ වසන යම් පුද්ගලයන්ට අයුතු වරප්‍රසාද ලබා දුන්විට තමාට හිරිහැරවලට මුහුණපාන්නට සිදුවේ යයි සිතා හෝ තමාට පාඩුවක් අලාබයක් වේ යැයි සිතා පාලකයා බියෙන් වැරදි ක්‍රියාවලට පෙළඹේ. තමා සෑපුවම හෘද සාක්ෂියට එකඟව ක්‍රියා කරන්නේ නම් මෙම භය නමැති අගතියෙන් මිදිය හැකි වේ.

මෝහය යනු මුලාවයි. හොඳ-නරක, යුක්තිය-අයුක්තිය තෝරා බේරා ගැනීමේ ඇති නොහැකියාව නිසා තීක්ෂණ බුද්ධියෙන් තොරව තීරණ ගැනීම අගතිගාමී වීමයි.

බෞද්ධ ඉගැන්වීම වන්නේ පාලකයා සතර අගතියෙන් වැළකී යුක්තිසහගතව කරුණා මෛත්‍රීනේ නිර්භීතව ප්‍රඥාවන්තව ක්‍රියා කරන්නෙකු විය යුතුය. අගතිගාමී වන්නාගේ යසස පිරිහීමට පත්වේ. ධාර්මික රාජ්‍ය පාලනයක් සඳහා සතර අගතියෙන් තොර වීම අවශ්‍ය බව බුදුරජාණන් වහන්සේ වදාරා ඇත.

(ලකුණු 05)



Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!

ii. **නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව :-**

පංච ඉන්ද්‍රියයන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත්වීමේ ප්‍රතිපදාව නෙක්ඛම්ම පාරමිතාවයි. බුද්ධ කාරක ධර්ම ලෙස හඳුන්වන දස පාරමිතා ධර්ම අතර තුන්වැන්න නෙක්ඛම්ම පාරමිතාවයි. තෘෂ්ණා මාන මිත්‍යා දෘෂ්ඨීයෙන් මිදී ප්‍රඥා, කරුණාවෙන් යුතුව පංච කාම සම්පත්තියෙන් ඉවත් වීම නෙක්ඛම්ම පාරමිතාවේ මූලික අංගයයි. මෙය පූරන බෝසත් උතුමෝ ත්‍රිවිධ ආකාරයකින් එය පූරණය කරති. තම බාහිර වස්තු, අඹුදරුවන් අත්හැරීම නෙක්ඛම්ම පාරමිතාවයි. ශරීරාවයන් නැති වුවත් කාමයන්ගෙන් වෙන් වී සිටීම නෙක්ඛම්ම උප පාරමිතාවයි. ජීවිතයට හානියක් වුවද කම් සැප නොවිඳීම නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාවයි. අප මහ බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පූරණය කළ ආකාරය මඛාදේව ජාතකයෙන් පැහැදිළි වේ. අසීමිත ආශාවන්ගෙන් යුක්තවීමට හේතු වන්නේ මහිච්ඡතාවය නිසාය. අඩු බලාපොරොත්තු ඇති බව යන අල්පේච්ඡතාවය ඉතා ප්‍රයෝජනවත් ය. මැදහත්ව කටයුතු කිරීමේ පුහුණුවක් නෙක්ඛම්ම පාරමිතාව තුළින් අප ජීවිතයට එක්කර ගත හැකි ය. සැහැල්ලු මනසකින් යුතු ව සෞඛ්‍ය සම්පන්නව හා සදාචාරාත්මකව දෛනික කටයුතු සිදු කිරීමට මෙම ගුණධර්මය ප්‍රගුණ කළ හැකි ය.

(ලකුණු 05)

(6) WWW.PastPapers.WiKi (6)

Downloaded from Past Papers Wiki - Extensive collection of Past papers, Notes and much more!